# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2018/9 – 2017 මැයි මස 09 වැනි අඟහරුවාදා – 2017.05.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත (136 වන අධිකාරය)**

6 (2) වැනි වගන්තිය යටතේ නිවේදනය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම (136 වන අධිකාරය) වූ පඩිපාලක සභා ආඥාපනතේ 6 (2) වගන්තිය සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 6 (1) වගන්තිය යටතේ ක්‍රියා කරමින්, මෙහි උපලේඛනයේ දක්වා ඇති නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය සම්බන්ධයෙන් මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධාන අදළ වන බවට නියෝග කරනු ලැබේ.

6(1) වගන්තිය යටතේ එකී නියමය කිරීම සඳහා වූ චේතනාව ඒ සම්බන්ධයෙන් වූ විරෝධතා කැඳවුම් කරනු ලබන දැන්වීම් ද සමඟ *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නිවේදනයක් මඟින් පළ කළ යුතු බවට එකී ආඥාපනතේ 7 වන වගන්තිය යටතේ වූ අවශ්‍යතාවය එය අංක 1987/37 සහ 2016 ඔක්තෝබර් මස 06 වන දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කිරීම මඟින් සපුරා තිබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2017 මැයි මස 04 වැනි දින,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
කම්කරු අමාත්‍යාංශය,
කොළඹ 05.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### ආඥාව

1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනතේ II කොටසේ විධිවිධානයන් මෙහි පහත දක්වෙන කර්මාන්තයට අදාළ වන්නේ ය. එනම් නාවික ප්‍රවාහනය හා මෙහෙයුම් සේවා කර්මාන්තය.

නෞකා තටාක, තොටුපල සහ වරාය පරිශ්‍රයන් ඇතුළත හා ඉන් පිටත සිදු කෙරෙන නාවික ප්‍රවාහනය, මෙහෙයුම් සේවා හා ඊට අනුබද්ධිත වෙනත් ප්‍රවාහන හා මෙහෙයුම් සේවාවලට අදාළව සේවයේ නිරත වන සේවකයන් මෙම පඩිපාලක සභාවෙන් ආවරණය වේ.

### *උපලේඛනය*

පහත සඳහන් සේවා කාණ්ඩයන්හි කාර්යයන් හා ඊට අනුෂාංගික කාර්යන්හි නිරත සේවකයින්ගේ වැඩ නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යටතට ගැනෙන්නේ ය.

**නුපුහුණු**

1. කාර්ය සහායක
2. නැව් කම්කරු (දියත්)
3. නැව් සේරදන්වරු
4. පයිප්ප සේරදන්වරු (දියේ)
5. ග්‍රීස් ගසන්නා
6. බඩු අසුරන්නා
7. සීනුව නාද කරන්නා / සංඥාකරු / ලැෂිංකරු
8. සහායක බාරගැනීමේ / බෙදා හැරීමේ නිලධාරී
9. බඩු ඔසවන්නා

**අර්ධ පුහුණු**

10. ඩෙක්මන්වරු
11. රියදුරු (දියේ)
12. යාත්‍රාකරු
13. ගැන්ට්‍රි දොඹකර සංඥාකරු
14. නිරාවරණ කිමිදුම්කරු
15. නැව් ආම්පන්න හසුරුවන්නා
16. සැලසුම් සහකාර (අංගන/ නැව් මත)
17. තටාක වැඩකරු
18. බාර ගැනීමේ / බෙදා හැරීමේ නිලධාරී
19. ක්‍රියාකාරී සහායක

**පුහුණු**

20. විංච් ක්‍රියාකරු
21. කව්ලුතන්දල්
22. නැව් බඩු මෙහෙයවීම් උපකරණ ක්‍රියාකරු
23. සහකාර අංශ අධිකාරී
24. බහලු මෙහෙයුම් උපකරණ ක්‍රියාකරු (QGC/RTG/Fork Lift/ Prime Movers/ Yard Tractors/ Crane/ Oil Pumps)
25. ඉංජිනේරු නිලධාරී
26. යන්ත්‍ර කාමර ශිල්පී
27. නාවික කිමිදුම්කරු
28. බහුවිධ නිපුණතා බෝට්ටු ක්‍රියාකරු
29. නැංගුරම්පොළ ඕවර්සියර්
30. ප්‍රදීපාගාර භාරකරු
31. සහකාර ක්‍රියාකරු
32. අන්තර් අංගන සම්බන්ධීකාරක
33. ඩෙක්/ වාප්පු පාලක

34. අංගන පාලක
35. අංගන සැලසුම්කරු
36. මෙහෙයුම් පාලක
37. කොක්ස්වේන්
38. රියදුරු (ටග් සහ ලෝන්ච්)
39. සහකාර ටග් යාත්‍රාපති
40. බෝසන්
41. කළමනාකරණ සහකාර (මෙහෙයුම්)
42. දියත් පාලක
43. නැව් මෙහෙයුම් පාලක (සැලසුම් ලිපිකරු)
44. මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී
45. බහුවිධ නිපුණතා ශිල්පී

*සැ. යු.*- ඉහතින් දක්වූ සේවක කාණ්ඩ නිරත වූ එක් එක් කාර්යයන්ට සෘජුව, වක්‍රව හෝ අනියම් ආකාරයෙන් සම්බන්ධ වන්නාවූ සේවකයින් ආවරණය වන අතර, එහෙත් කවර හෝ නියෝගයට, විධිවිධානයකට යටත් වන්නා වූ කාර්යාලීය, ඉංජිනේරු හා මෝටර් රථ ප්‍රවාහන කර්මාන්තයන්හි නිරත සේවක කාණ්ඩ මෙම පඩිපාලක සභා ආවරණයට යටත් නොවන්නේ ය.

05 – 679

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.